# 20 නුවාන හා මංගල්‍යය

ජූඩ් : අම්මේ...... කිරිබත්වල සුවඳ! අද දවල්ට කිරිබත් ද?

අම්මා : පුතාට අමතක වුණා ද අද අපේ පල්ලියේ මංගල්‍යයට කොඩිගහ ඔසවන දවස කියලා? ඒකයි, මම කිරිබත් හැදුවේ.

ජූඩ් : ඔව් නේ ද? (අසල සිටින සොහොයුරිය අමතමින්) අක්කේ, අද හවසට බඩ පැළෙන්න කිරිබත් කන්න පුළුවන් නේ ද?

ස්ටෙලා : මල්ලිට ඉතිං කන්න තියෙනවා නම් ඇතිනේ. අම්මේ, මේ පාර අපේ නුවානය දවසට යි, පල්ලියේ මංගල්‍යයට යි අඳින්න අලුත් ම මෝස්තරයේ ගවුම් දෙකක් මට ඕනේ.

අම්මා : දරුවනේ පල්ලියේ මංගල්‍යය කියලා කියන්නේ කනබොන එකවත් මෝස්තරයට අඳින පළඳින එකවත් නෙමෙයි.

දෙදෙනා ම: එහෙනම් අම්මේ?

අම්මා : පුතේ, මේ කාලේ දී තමයි අපි දෙවියන් වහන්සේට තව තවත් ළංවෙන්න ඕනේ. ඒ වගේ ම මීසමේ හැම දෙනා ම එකතු වෙලා අපේ පල්ලිය කැපකරලා තියෙන මුනිවරයාට ස්තුති කරන්න ඕනේ. හොඳ ළමයි වගේ ඉක්මන් කරලා ලෑස්ති වෙන්න කෝ පල්ලියට යන්න.

සෑම වසරක ම අපගේ දේවස්ථානවල විවිධ මංගල්‍ය සැමරෙනු ලැබෙයි. නිදසුන් ලෙස, පාස්කු හා නත්තල් මංගල්‍ය දැක්විය හැකි ය. එම මංගල්‍ය විශ්ව හෝ ලාංකේය ශුද්ධ වූ සභා මාතාව එක ම දිනයක සමරන්නී ය. ඒවාට අමතර ව සෑම දේවස්ථානයකට ම ආවේණික විශේෂ මංගල්‍යයක් ඇත. එනම්, තම දේවස්ථානය කැපකර ඇති ශුද්ධවන්තයාගේ හෝ ශුද්ධවන්තියගේ හෝ මංගල්‍යය යි. මීසම් සේවක පූජාප්‍රසාදීන් වහන්සේලා හා මීසමේ ජනතාව එකට එක් ව එම මංගල්‍යය මහත් උත්සවශ්‍රීයෙන් සමරති.

දේවස්ථාන මංගල්‍ය පැවැත්වීමට හේතු

- ආධ්‍යාත්මික ජීවිතයෙහි ප්‍රබෝධයක් ඇති කර ගැනීමට
- දේව වචනයෙන් ජීවිතය පෝෂණය කර ගැනීමට
- දේවස්ථානය කැපකර ඇති ශුද්ධවන්තයාගේ මැදිහත්කම තුළ ලද සැම දීමනාවකට ම තුති පිදීමට
- එතුමන්ලාගේ ජීවිත ආදර්ශ මෙනෙහි කර, ජීවිත හැඩගස්වා ගෙන අන් අයට ආදර්ශමත් කිතුනුවන් ලෙස ජීවත් වීමට
- ඉදිරි වර්ෂය තුළ මීසමේ මෙන් ම මීසම්වාසී ජනතාවගේ ජීවිත එතුමාණන්ගේ මැදිහත්කමට භාර කිරීමට

## කොඩිගස එසවීමේ අරුත


20.1 රූපය - කොඩිගස එසවීම

කොඩිගස එසවීමත් සමග මීසමේ වාර්ෂික මංගල්‍යය ආරම්භ වේ. ධර්මදූත පියවරුන් මෙරට ධර්මදූත සේවයේ නිරත ව සිටින කාලයෙහි ප්‍රමාණවත් පූජාප්‍රසාදින් වහන්සේලා නොසිටියහ. එබැවින් මීසමකට පියතුමකු පැමිණියේ මාස කිහිපයකට වරක් හෝ වසරකට වරක් ය. එසේ පැමිණෙන පියතුමා සතියක් හෝ දෙකක් මීසමේ රැඳී සිටිමින් මීසම් ජනතාවගේ ආධ්‍යාත්මික අවශ්‍යතා ඉටු කළේ ය. එමෙන් ම එතුමා දේවස්ථානය කැප කර ඇති ශුද්ධවන්තයාගේ මංගල්‍යය සැදැහැවත්හු හා එක් ව සැමරීය. එහි දී මීසම් භාර පියතුමා පැමිණ ඇති බවත් තම ආධ්‍යාත්මික පෝෂණය සඳහා සහාය එතුමාණන්ගෙන් ලබාගත හැකි බවත් අවට සිටින කිතුනු ජනතාව දැනුවත් කළේ කොඩිගස එසවීමෙනි.

## නුවාන

කොඩිගස එසවීමෙන් අනතුරු ව නුවාන පැවැත්වේ. "නුවානය" (Novena) යන්න ලතින් බසින් "නෝවෙම්" (Novem) යන්නෙන් බිඳී ආවකි. එහි අර්ථය "නවය" යන්න ය. දින නවයක් පුරා විශේෂ ඉල්ලීම් උදෙසා පවත්වනු ලබන යැදුම් මෙහෙයක් ලෙස නුවාන අර්ථ දැක්විය හැකි ය. කොඩිගස ඔසවා දින

අටක් නුවාන පවත්වා නවවන දින සන්ධ්‍යා මෙහෙය (වෙස්පර්ස්) පවත්වා දින නවයක යැදුම් මෙහෙය අවසන්කර දහවන දින දේවස්ථානයේ මංගල්‍යය පැවැත්වීම කතෝලික සම්ප්‍රදාය යි. මෙම කාලවකවානුවට පසුබිම ශුද්ධාත්ම (පෙන්තකොස්ත) මංගල්‍යය යි. එනම්, ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයේ සිට දින 09ක් මරිය තුමිය හා අපෝස්තුලුවරු ඇතුළු 120 දෙනෙක් යාච්ඤා කර දසවන දින ශුද්ධාත්ම වරම් ලැබූහ. එම 120 දෙනා මෙන් අප ද මංගල්‍යය සමය තුළ ආධ්‍යාත්මික වරප්‍රසාද ලබා ගැනීමට කටයුතු කළ යුතු වෙමු. ඒ සඳහා;

- සෑම දින ම නුවානවලට සහභාගි විය යුතු ය.
- දිනපතා දිව්‍ය පූජාවට සහභාගි වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත යුතු ය.
- අන් දිනවලට වඩා යාච්ඤාවේ ජීවිතයක් ගත කළ යුතු ය.
- යහපත් පාපෝච්චාරණයක් කර ආධ්‍යාත්මික නවෝදයක් ලබා ගැනීමට උනන්දු විය යුතු ය.
- සන්ධ්‍යා මෙහෙයට හා මංගල්‍ය දිව්‍ය පූජාවට සහභාගි විය යුතු ය.
- මංගල්‍ය දින පෙරහැරට භක්තියෙන් හා උද්යෝගයෙන් සහභාගි විය යුතු ය.
- මීසමේ දෙව්මැදුර කැප කළ ශුද්ධවරයාගේ ජීවිතාදර්ශය අනුගමනය කිරීමට අදිටන් කරගත යුතු ය.

මංගල්‍යය කාලසීමාවේ දී මීසම්භාර පූජාප්‍රසාදීන් වහන්සේලා,

- මීසමේ ජනතාවගේ ආධ්‍යාත්මික පෝෂණයට ඉවහල් වන්නා වූ ක්‍රියාවනට මුල්තැනක් දීමට
- නුවාන දිනවල දී සුවිශේෂී වූ තේමා යටතේ දේව වචනය මෙනෙහි කිරීමට
- මීසමේ නාම සාන්තුවරයාගේ ජීවිතය ගැන මෙනෙහි කිරීමට මීසම්වාසීන් යොමු කිරීමට
- දිනපතා දිව්‍ය පූජාවට හා භක්ති අභ්‍යාසයන්ට සම්පූර්ණයෙන් ම සහභාගි වීම සඳහා සැදැහැවත් ජනතාව යොමු කිරීමට
- සැබෑ මනස්ථාපයක් තුළින් සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීම සඳහා ජනතාව යොමු කිරීමට
- කාලීන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් සංවිධානාත්මක ව දානමය ක්‍රියාවන් දියත් කිරීමට

අවධානය යොමු කරති.

දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය ගමට ආශිර්වාදයකි. එමෙන් ම ලැබූ සැම වරප්‍රසාදයකට ම තුති පුදන්නට ලැබූ මහඟු අවස්ථාවකි. එබැවින් මංගල්‍යය හා බැඳුණු බාහිර ආටෝපවලින් මිදී ආධ්‍යාත්මික නවෝදයක් ලබා ගනිමින් අප සතු දේ අන් අය හා බෙදා ගනිමින් දෙවිඳුන්ට ප්‍රසන්න මංගල්‍යයක් සැමරීමට අප සැම උනන්දු විය යුතු ය.

**ක්‍රියාකාරකම**

1. පුරාණ ශ්‍රී ලංකාවේ කොඩිගස එසවීමේ පසුබිම ලියන්න.
2. "නුවාන" යන්න අර්ථ දක්වන්න.
3. දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය අර්ථවත් ව සැමරීමට ඔබ කළ යුතු කාර්යයන් **තුනක්** ලියන්න.
4. ඔබගේ දේවස්ථානය කැපකර ඇති ශුද්ධවන්තයා හෝ ශුද්ධවන්තිය පිළිබඳ ව පහත කරුණු සැළකිල්ලට ගනිමින් බිත්ති පුවත් පතකට ලිපියක් ලියන්න.
   - දේවස්ථානය කැපකර ඇති ශුද්ධවන්තයාගේ නම
   - එම මංගල්‍යය කතෝලික සභාව සමරන දිනය
   - එම මංගල්‍ය ඔබගේ දේවස්ථානයේ සමරන දිනය
   - එතුමාගේ ජීවිත තොරතුරු
   - එතුමාගෙන් ඔබට ගත හැකි ආදර්ශ

   (වචන 75 ප්‍රමාණවත් ය. සුදුසු මාතෘකාවක් ද යොදන්න.)



**ජීවිතයට බිඳක්**

***සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා මීසමේ වාර්ෂික මංගල්‍යට සහභාගි වෙමු.***